ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2007/2008

ඉඩම් නීතිය - **LWU 3312**

කාලය - විනාඩි 40

---

දිනය - 2007.12.13 වේලාව - පෙ.ව. 11.30 - ප.ව. 12.10 දක්වා

---

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. මල්වත්ත නැමැති ඉඩමේ හිමිකරු වන පියල් 1992 දී තම ඉඩම රැකබලා ගැනීම සඳහා පුංචා පත් කල අතර ඔහුට සිය පවුල සමඟ පැමිණ ඉඩමේ වාසය කරන ලෙස කීවේය. පුංචා මහන්සි වී වැඩ කල අතර ඉඩමේ එළවළු හා පළතුරු වගා කළේය. පියල් මසකට වරක් මල්වත්ත ඉඩමට පැමිණ එළවළු හා පළතුරු ගෙදර ගෙන ගියේය. 1993 වර්ෂයේ දිනක, පියල් ඉඩමට ගිය විට පුංචා ඊට විරෝධය පෑ අතර පියල්ට ඉඩමට ඇතුළුවීමට ඉඩ නොදෙන ලදී. පුංචා ඉඩමේ පලදාව කිසිවක් පියල්ට දීම ද ප්‍රතික්ෂේප කලේය. පසුව පුංචා විසින් ඉඩමේ නිවසක් ද සාදන ලදී. මාස කිහිපයකට පසුව පියල්, තම මිතුරන් කිහිප දෙනෙකුගේ උපකාරයෙන් පුංචා සහ ඔහුගේ පවුල ඉඩමෙන් නෙරපා හරින ලද නමුත් සති තුනක් තුල පුංචා පැමිණ ඉඩමේ පාලනය ලබා ගත්තේය.

වර්ෂ 2001 දී, පියල් මල්වත්ත ඉඩමේ පරම උරුමක්කරු ලෙස තම එකම දරුවා වන දහහතර හැවිරිදි චමිලා තබා මිය ගියේය. වර්ෂ 2003 දී පුංචා මිය ගිය අතර ඔහුගේ විසි හැවිරිදි පුත් සිරි, තම මව සමඟ මල්වත්තෙහි දිගටම වාසය කලේ පියල්ගේ සහෝදරයන් විසින් ඔවුන්ව පලවා හැරීමට ගත් උත්සාහයන් මධ්‍යයේය.

2006 දී චමිලා මල්වත්ත සඳහා අයිතිය ප්‍රකාශ කරවා ගැනීමේ නඩුවක් පැවරුවාය. සිරි කාලාවරෝධය අනුව ඉඩමේ හිමිකාරත්වය පතයි.

සිරිට උපදෙස් දෙන්න.

02. ශ්‍රී ලංකා අධිකරණ මගින් භුක්තික නඩුකරයක දී අවශ්‍ය වන සන්තකයේ ස්වභාවය දැඩි සිවිල් සන්තක **(civiles possessio)** ප්‍රවේශයක සිට වඩාත් නම්‍යශීලී ප්‍රවේශයකට යොමුවීම සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර ශ්‍රී ලංකාවේ හා දකුණු අප්‍රිකාවේ අදාල අධිකරණ තීන්දු මගින් සනාථ කරන්න.

- හිමිකම් ඇවිරිණි. -